පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 09

# අවසාන වාර පරීක්ෂණය - 2022

## භූගෝල විද්‍යාව I, II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : .............................

කාලය : පැය 02 යි.

## භූගෝල විද්‍යාව I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

01. දූපතක් යනු සාගරයෙන් වට වූ කුඩා ගොඩබිමකි. ආසියා මහද්වීපයට අයත් දූපතක් වන්නේ,

(1) මැඩගස්කරය (2) ජපන් දූපත් (3) අයිස්ලන්තය (4) සිසිලිය

02. ලෝකයේ ප්‍රධාන ආගම් රැසක නිජබිම වී ඇති මහද්වීපය වන්නේ,

(1) අප්‍රිකා (2) උතුරු ඇමරිකා (3) ඕස්ට්‍රේලියා (4) ආසියා

03. ආසියානු ගොඩබිම් ප්‍රදේශයේ පිහිටා ඇති මුහුදු මට්ටමට වඩා පහළින් පිහිටි මුහුදක් වන්නේ,

(1) කළු මුහුද (2) කැස්පියන් මුහුද (3) මළ මුහුද (4) රතු මුහුද

04. ප්‍රතිරෝධක පාෂාණ වලින් සමන්විත ප්‍රපාතාකාර බෑවුම් ප්‍රදේශ වන 'වෙරළ දඹ' හු ලක්ෂණය දැකිය හැක්කේ,

(1) ත්‍රිකුණාමලයේ (2) දෙවුන්දර තුඩුවේ (3) පුත්තලමේ (4) කයිට්ස් දූපතේ

05. පහත දැක්වෙන කඳු අතරින් ශේෂ කන්දක් වන්නේ,

(1) සමනල (2) රිටිගල (3) නකල්ස් (4) නමුණුකුල

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් 'නි' වටා ද වැරදි නම් 'වැ' වටා ද රවුමක් අඳින්න.**

06. යුරෝපය හා ආසියාව එකම භූමි ස්කන්ධයක් ලෙස පිහිටා ඇති නිසා යුරේසියාව ලෙස හඳුන්වයි. ( නි / වැ )

07. ලෝකයේ විශාලතම කඳු පන්තිය පිහිටා ඇත්තේ ඕස්ට්‍රේලියා මහද්වීපයේ ය. ( නි / වැ )

08. 'ධවල ගිරි' හා 'මකාලු' යූරල් කඳු පන්තියේ කඳු ශිඛර වේ. ( නි / වැ )

09. මධ්‍යම කඳුකරයෙන් පටන් ගන්නා ගංගා විවිධ දිශාවන්ට අරීය රටාවකට අනුව මුහුදට ගලා බසී. ( නි / වැ )

10. මුතුරාජවෙල කඩොලාන ශාක දැකිය හැකි ප්‍රදේශයකි. ( නි / වැ )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගලපා නිවැරදි පිළිතුර දැක්වෙන වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

11.

| 'අ' | 'ආ' |
|---|---|
| 1) ඕබි හා යෙනිසි | A. පැසිපික් සාගරය |
| 2) අමුර් හා හොවැංහෝ | B. ආක්ටික් සාගරය |
| 3) ගංගා සහ ඉන්දු | C. අත්ලාන්තික් සාගරය |
| | D. ඉන්දියන් සාගරය |

(1) BAD (2) ABD (3) BCA (4) ABC

12.

| 'අ' | 'ආ' |
|---|---|
| 1) තුඩුව | A. නයිනතිව් |
| 2) දූපත | B. මිහින්තලය |
| 3) ශේෂ කඳු | C. කිරිගල්පොත්ත |
| | D. දෙවුන්දර |

(1) ABC (2) DAB (3) ADC (4) DBA

13.

| 'අ' | 'ආ' |
|---|---|
| 1) මහවැලි ගඟ | A. සේනානායක සමුද්‍රය |
| 2) යාං ඔය | B. වික්ටෝරියා ජලාශය |
| 3) ගල් ඔය | C. හුරුළු වැව |
| | D. උඩවලව ජලාශය |

(1) ABC (2) BCD (3) BCA (4) ABD

14.

| 'අ' | 'ආ' |
|---|---|
| 1) කටු පඳුරු හා ලඳු කැලෑ | A. කඩොල් |
| 2) කඩොලාන | B. පතොක් |
| 3) පහතරට වියළි මිශ්‍ර සදාහරිත | C. හුලංහික් |
| | D. පලු |

(1) BAD (2) ABC (3) BCD (4) ACD

15. ආසියානු කලාපයේ විවිධ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වැදගත් රටවල් නිවැරදිව ගලපා ඇති වරණය තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1) කෘෂිකාර්මික | A. ජපානය |
| 2) කාර්මික | B. ඩුබායි |
| 3) සේවා | C. පාකිස්ථානය |
| | D. ප්‍රංශය |

(1) CDA (2) ABC (3) BCD (4) CAB

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වගන්ති වල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වරහනින් තෝරා ලියන්න.**

(ටිබෙට් සානුව, පර්සියන් බොක්ක, කැස්පියන් මුහුද, එවරස්ට් මුදුන, දුඹුරු, කළු, උතුරු, ඌව, සූර්ය ශක්තිය, ගල් අඟුරු)

16. යුප්‍රටීස් සහ ටයිග්‍රීස් යන ගංගා ........................................................................................ ට ගලා බසී.

17. ........................................................................................ 'ලෝකයේ පියස්ස' යන අන්වර්ථ නාමයෙන් හඳුන්වයි.

18. භූ ලක්ෂණ සිතියමක සමෝච්ච රේඛා ........................................................................................ වර්ණයෙන් දක්වයි.

19. ශ්‍රී ලංකාවේ අඩුම ජන ව්‍යාප්තියක් පෙන්වනු ලබන්නේ ........................................................................................ පළාතේ ය.

20. ........................................................................................ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයකි. (20×2 =40)

# භූගෝල විද්‍යාව II

- ❖ **පළමු ප්‍රශ්නයේ (අ) සහ (ආ) කොටස් වලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- ❖ **ප්‍රශ්න අංක 02 සිට 06 දක්වා ප්‍රශ්න වලින් ප්‍රශ්න 04 ක් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. (අ)පහත දී ඇති ලංකා සිතියම අධ්‍යයනය කරමින් අදාල ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ඇතුලත් ඉංග්‍රීසි අක්ෂරය ලියන්න.


(i) ABC අක්ෂර අතරින් පොලොන්නරුව දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක්ද? ..................................

(ii) DEF අක්ෂර අතරින් පුත්තලම කලපුව දැක්වෙන අක්ෂරය කුමක්ද? ..................................

(iii) GHI අක්ෂර වලින් දක්වා ඇති ගංගා අතරින් කැළණි ගඟ දැක්වෙන අක්ෂරය කුමක්ද? ..................................

(iv) KLM අක්ෂර අතරින් තෙත් කලාපය දැක්වෙන අක්ෂරය කුමක්ද? ..................................

(v) PQR අක්ෂර අතරින් කලා වැව දැක්වෙන අක්ෂරය කුමක්ද? .................................. (5×2 =10)




(ආ) පහත දී ඇති ලෝක සිතියම අධ්‍යයනය කරමින් අසා ඇති ප්‍රශ්න වලට නියමිත ඉංග්‍රීසි අක්ෂරය ලියන්න.


(i) ABC අක්ෂර වලින් දැක්වෙන මුහුදු අතරින් රතු මුහුද දැක්වෙන අක්ෂරය කුමක්ද? ..................................

(ii) DEF අක්ෂර වලින් දැක්වෙන කඳු වැටි අතරින් හිමාලය කඳු වැටිය දැක්වෙන අක්ෂරය කුමක්ද? ..................................

(iii) GHI අක්ෂර වලින් දක්වෙන රටවල් අතරින් ලෝකයේ ප්‍රධාන කාර්මික රටක් වන ජපානය දැක්වෙන අක්ෂරය කුමක්ද? ..................................

(iv) KLM අක්ෂර අතරින් නිතර වායු පීඩන වෙනස්කම් සිදුවන බෙංගාල බොක්ක දැක්වෙන අක්ෂරය කුමක්ද? ....................

(v) PQR අක්ෂර අතරින් කහ ගඟ හෙවත් හොවැංහෝ ගංගාව දැක්වෙන අක්ෂරය කුමක්ද? .................................. (5×2 =10)




02. (i) ආසියා මහද්වීපයට අයත් ප්‍රමාණයෙන් විශාල දූපත් 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ආසියානු මහද්වීපයේ බිහි වූ ලොව ඉපැරණි ශිෂ්ටාචාර 03 නම් කරන්න. (ලකුණු 03)

(iii) ආසියානු ප්‍රදේශයේ සුවිශේෂත්වය පෙන්නුම් කරන සාධක 02 ක් දක්වා ඉන් 01 ක් විස්තර කරන්න. (ලකුණු 05)

03. (i) මධ්‍යම කඳුකරයේ දක්නට ලැබෙන භූ ලක්ෂණ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම 03 සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප 02 ක් නම් කර ඉන් 01 ක දක්නට ලැබෙන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) ලෝකයේ රටවල් සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන සංවර්ධන දර්ශක 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන ජනාවාස වර්ග 03 නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් බෙදා දක්වන ප්‍රධාන අංශ 02 ක් දක්වා ඉන් 01 ක් විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) පරිසර පද්ධතිය නිර්මාණය වී ඇති අජීවී සංරචක 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පරිසරයට අහිතකර මානව ක්‍රියාකාරකම් 03 සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පාරිසරික තුලිතතාව බිඳවැටීම නිසා ඇති වන අහිතකර ප්‍රතිඵල 02 ක් දක්වා 01 ක් විස්තර කරන්න. (ලකුණු 05)

06. (i) 1:50,000 භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන ප්‍රධාන භෞතික ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) 1:50,000 භූ ලක්ෂණ සිතියමක සංස්කෘතික ලක්ෂණ අතර මාර්ග පද්ධතියට අයත් වර්ග 03 නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් වල භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර සම්බන්ධයක් පවතී. ඊට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05)